සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2022

11 ශ්‍රේණිය **සිංහල සාහිත්‍ය රසාස්වාදය** කාලය පැය 03 යි.

| නම/ විභාග අංකය: |
|---|

- මෙම ප්‍රශ්න පත්‍රය I පත්‍රය හා II පත්‍රය යන කොටස් දෙකකින් සමන්විත ය.

## I - පත්‍රය

- I පත්‍රයේ ඇති ප්‍රශ්න දෙක සඳහා ප්‍රශ්න පත්‍රයේම උත්තර සපයා වෙනම භාරදෙන්න.

(1) (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ''ජීවත්ව උනිම් නම් සැපසේ අවුත් දකිනෙම් වේද?''

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

.............................................................................................................

(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවුරුන් ද?

.............................................................................................................

(ii) ''මේ තෙම තමාගේ එකම දුව අප සත් දෙනාට ම දේල මුගෙ නොකටයුත්තක් බලව''

(අ) මෙහි 'මේ තෙම' යනුවෙන් සඳහන් වන්නේ කවුරුන් ද?

.............................................................................................................

(ආ) මෙම ප්‍රකාශය කළ අවස්ථාව කුමක් ද?

.............................................................................................................

(iii) අමිත ගුණ නුවණ යුතු උතුමෝ පබඳ
අනත වෙහෙස ලදුවත් නොමවෙති දුහද
දිගත පතළ සුවඳැති සොඳ සඳුන් කඳ
සිඳිත මඩිත එක ලෙස පැතිරෙයි සුවඳ

(අ) ''අමිත'' ''පබඳ'' යන පදවල අර්ථය ලියන්න.

.............................................................................................................

(ආ) මෙහි මුල් පද දෙකෙහි අදහස ලියන්න.

.............................................................................................................

(iv) ඌ හිටි හැටියෙම උඹව තනිකරලා උඹව අතැරලා ගියා

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද? කාහට ද?

..............................................................................................................................

(ආ) මෙම උද්ධෘතය ඇතුළත් කෙටි කතාව සිංහලයට නගන ලද්දේ කවුද?

..............................................................................................................................

(v) පොරව කියත කලුවරේ ම පණ ආවා ලෙසිනේ

මගෙ ඇඟ උඩ පට්ටල් බැඳ කපනු ඉරනු වැන්නේ

දෙයියන්ගේ මල්ලිලාට දෙවියො ම රැවටෙන්නේ

කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ

(අ) ''දෙයියන්ගේ මල්ලිලාට දෙවියොම රැවටෙන්නේ'' යන පදයෙහි අදහස කුමක් ද?

..............................................................................................................................

(ආ) මෙම පැදි පෙළ රචනා කළේ කවුරුන් ද?

..............................................................................................................................

(ලකුණු 4 x 5 = 20)

02 පහත දැක්වෙන ලද්‍ය - පද්‍ය කොටස් දෙකින් එක කොටසකට පමණක් උත්තර සපයන්න.

බෝධිසත්ත්වයන්ගේ අභිප්‍රාය සිතූ පැතූ ලෙස ම සිද්ධ වන බැවින් ඒ රන්රුව කියා නිමවිය නොහැකි රූපශෝභා ඇත්තේ විය. එකල මහ බෝධිසත්ත්වයෝ ඒ රන්රුව සුරත් කොමු පිළියක් අඳවා ශ්‍රී යහන් ගර්භයෙහි සිටවූහ. ඉක්බිති බෝධිසත්ත්වයෝ තරාල ඇඳුරා විසින් ගෙනෙන ලද රන්රුවට නින්ද කොට ''යව අපගේ ගර්භයෙහි තුබූ ස්වර්ණ රූපය ගෙනවයි'' ස්වර්ණකාරයාහට නියෝග කළේය. එසඳ ඒ ගොස් ශ්‍රී යහන් ගර්භයට වැද ඒ රන්රුව දැක කුමාරයන් වහන්සේ හා සමග ක්‍රීඩා පිණිස ආ දිව්‍යප්සරාවක් වනැයි සිතා අත දික්කරන්නටත් නො පොසත්ව බෝධිසත්ත්වයන් කරා ගොස් ''දේවයන් වහන්ස බිසවුන් වහන්සේ තනිව වැඩසිටි සෙයින් වැද්ද නො හෙම්යි කී ය.'' නැවත බෝධිසත්ත්වයන් විසින් ''ඇඳුර, එ රන්රුව සැක නැතිව හැර ගෙන එවයි කිය යවන ලදුව ගොස් ගෙනායේ ය. ඉක්බිති බෝධිසත්ත්වයෝ බඩාලා ගෙනා රත්‍රන් රුව ගබෙහි ලා තමන් කළ රුව ආභරණ ආදින් සරහා රථ යානාවෙක්හි තබා ''මෙබඳු රූප ශ්‍රී ඇති කෙනෙකු ලදින් නම් පාවා ගනිම්'' කියා රන්රුව මෑණියන් සමීපයට යවූහ. ඒ දැක බිසවු සතුටු ව අමාත්‍යයන් රැස් කරවා ''සගයෙනි, මපුතණුවෝ නම් මහ පිනැත්තාහ. ශක්‍ර දේවේන්ද්‍රයන් විසින් දෙන ලද කෙනෙක. එහෙයින් සදුසු කුමාරිකා කෙනෙකුන් ලැබෙති. තෙප හැම මේ රුන්රුව පිළිසන් රථ යානාවෙක තබා ගෙන මුළු දඹදිව ඇවිදිමින් දුටු නම් ඒ රජහට මේ රන්රුව දී ඔක්කාක රජ්ජුරුවන් වහන්සේ නුඹවහන්සේ සමග විවාහ සම්බන්ධයක් කරනු කැමති සේකැ'' යි කියා දවස් නියම කොට එවයි නියෝග කළාහු ය.

(1) මෙම පාඨයෙහි සඳහන් පරිදි බෝසතුන් රන්රුවක් නිර්මාණය කළේ කුමක් අරමුණු කොට ගෙනද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(ලකුණු 04)

(2) තරාල ඇඳුරා ගෙනෙන ලද රන්රුවට නින්ද කළ බෝධිසත්ත්වයන් ඔහුට කළ නියෝගය කුමක් ද?

..........................................................................................................................................................

.......................................................................................................................... (ලකුණු 04)

(3) කුස කුමරු කළ එම නියෝගය ඉටු කිරීමට තරාල ඇඳුරා පළමු වර අසමත් වූයේ ඇයිදැයි පැහැදිලි කරන්න.

..........................................................................................................................................................

.......................................................................................................................... (ලකුණු 06)

(4) සීලවතී බිසව අමාත්‍යයන් රැස්කර ඔවුන්ට පැවසූ දේ ඡේදය ඇසුරෙන් පැහැදිලි කරන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

.......................................................................................................................... (ලකුණු 06)

**නැතහොත්**

පෙරදිග ගොරහැඩි රකුසෝ

මගේ ධ්‍යානය ඇයි කඩන්නේ

නිද ගන්න පොරව ගත්ත

කලු රෙදි පොට

මොකට ද මේ

තීරුවලට ඉරා දමන්නේ

කුරුල්ලන්ට ගල් ගහලා

උන් හොඳටම බිය කරලා

මල් පොහොට්ටු තිගැස්සිලා

කඳුළු හෙලනවා

ඇස් දෙක මම අරින්නෙ නෑ

තුරුලු කරන් භාවනාව

නැවතත් යන්නට යනවා

මම

මගේ දැහැන ලෝකයට ම

(i) මෙම පද්‍ය පන්තියට වස්තු විෂය වී ඇත්තේ කුමක් ද?

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

(ලකුණු 04)

(ii) මෙම නිර්මාණය සඳහා යොදාගෙන ඇති කාව්‍යෝක්ති දෙකක් ලියන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

(ලකුණු 04)

(iii) හිරු උදාවීම කවියාගේ උදහසට ලක්වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

(ලකුණු 06)

(iv) පද්‍ය පන්තියේ සාර්ථකත්වයට කවියා යොදාගත් ආකෘතිය හේතු වී ඇති ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

(ලකුණු 06)

## II - පත්‍රය

සැලකිය යුතුයි :

- **පළමුවැනි ප්‍රශ්නය ද, 02, 03, 04, 05 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

(01) පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න. පිළිතුරක වචන 200 ක් වත් තිබිය යුතුය.

මගක් නම්
පියවර මතින්
පියවර තබා
තැනූ මගක් ම යි
අතර මඟ ළත නොවී
මුව දොර සොයා යන
ගඟක් ම යි

සිය දහස්
කෝ වේ හමුවනා
මං සන්ධි පසුවන
අතවනා
දහසක් දෙනා
එක පියවරින්
දහසක් යොදුන් දුර
අරඹනා
මඟකට දොසක් නොකියන්
නැත ඊට නිසි කාරණා

අම්බලම්
විසිතුරු සල්පිලෙන්
වටරවුම්
පදිකා මල් වැටෙන්
සෙවණ ලු සඳන
තුරුලිය පෙළින්
සැදි දෙපස මනරම් - සෝබනා

මොහොතක ඉසිඹු
ලබනා විනා
නැත අතරමග
නතරවන වාසනා

මඟක් නම්
ඒ මඟක් ම යි
නොමඟක් නොවෙයි
මඟ නවතිනා

(අ) මෙම පැදිපෙළට පාදක වූ අත්දැකීම
(ආ) මෙම පැදිපෙළින් මතු කෙරෙන ජීවන දෘෂ්ටිය
(ඉ) කවියා සිය අත්දැකීම් සාර්ථකව ඉදිරිපත් කිරීම සඳහා යොදා ගත් ආකෘතිය
(ඊ) පැදිපෙළ සාර්ථක කර ගැනීම සඳහා භාවිත කර ඇති කාව්‍යාලංකාර
(උ) කවි පෙළෙහි අපූර්වත්වය (ලකුණු 6 x 5 = 30)

(02) අලගියවන්න මුකවෙටිතුමා සාරධර්ම සුරැකීම සඳහා දරා ඇති උත්සාහය නියමිත පද්‍ය පන්තියෙන් උදාහරණ තුනක්වත් දක්වමින් විමසුමට ලක්කරන්න. (ලකුණු 15)

(03) කුස ජාතක කතාවේ සාර්ථකත්වයට ප්‍රබල සංකල්ප රූප මැවෙන අයුරින් අවස්ථා නිරූපණය බලපා ඇති ආකාරය උදාහරණ තුනක්වත් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

(04) ඇතැම් මිනිසුන්ගේ නොමනා ක්‍රියාකාරකම් සත්ත්ව සංහතියේ පැවැත්මට තර්ජනයක් වී ඇති ආකාරය ඇත්ගාලේ දරුපෙම් පද්‍ය පන්තිය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(05) ශෝක වේදනා දරාගනිමින් ජීවිතයේ සමාර්ථයට මුහුණ දෙන්නට වෙර දරන චරිතයක් ලෙස ඉයෝනාගේ චරිතය අගය කළ හැකිය. වැලපීම කෙටිකතාව ඇසුරෙන් විමසන්න. (ලකුණු 15)

**පිළිතුරු පත්‍රය - I කොටස**

01 (i) (අ) කුස රජතුමා
(ආ) සීලවතී බිසව

(ii) (අ) මද්‍ර රජතුමා
(ආ) පබාවතිය ලබාගැනීමට සත් රජවරුන් සාගල නුවරට පැමිණි අවස්ථාවේ දී

(iii) (අ) අමිත - අප්‍රමාණ / පබඳ - ප්‍රසිද්ධ
(ආ) අප්‍රමාණ වූ ගුණයෙන් හා නුවණින් යුත් සුප්‍රකට උත්තමයෝ කෙළවරක් නැති හිරිහැරවලට පාත්‍ර වුවත් දුෂ්ට සිතක් ඇතිකොට නොගනිති.

(iv) (අ) කුෂ්මා ඉයෝතිව් විසින් අශ්වයාට
(ආ) අමරදාස වීරසිංහ මහතා

(v) (අ) මුදල් වලින් ඕනෑම දෙයක් යටපත් කළ හැකි බව, නීතිය වුවද යටපත් වන බව, දෙවියන් වුවද රැවටිය හැකි බව
(ආ) නන්දන වීරසිංහ මහතා

02. (i) එබඳු රූපශ්‍රී ඇති කෙනෙකු ලද හොත් විවාහ කර ගැනීමේ අරමුණෙන්

(ii) කුස කුමරුගෙ ගර්භයෙහි ඇති රන් රුව ගෙනෙන ලෙස නියෝග කිරීම

(iii) තරාල ඇඳුරා ශ්‍රී යහන් ගර්භයට ගිය පසු රන් රුව දැක ඒ දිව්‍ය අප්සරාවක් යයි රැවටුණු නිසා (ඉතා විශිෂ්ට ලෙස එම රන්රුව රැගෙන දඹදිව ඇවිදිමින් මේ හා සමාන රුවක් ඇති කුමාරිකාවක දුටුහොත් රන් රුව ඒ රජතුමාට දී වාවහ යෝජනාව ඉදිරිපත් කරන ලෙසත් පැයසීම

<u>නැතහොත්</u>

(i) අලසව නිදාසිටින අයෙකුට හිරු උදාව පිළිබඳ දැනෙන ආකාරය

(ii) රූපක භාවිතය / සංකේත භාවිතය / ව්‍යාගාර්ථ භාවිතය

(iii) හිරු උදාවීමත් සමග නින්දෙන් අවදිවීමට සිදුවීම ගැන කවියා අප්‍රසාදයට පත්වීම ඔහු තවදුරටත් නින්ද අපේක්ෂා කිරීම, සූර්ය කිරණ රාක්ෂයන් සංකේතවත් කිරීමෙන් ඔහුගේ උදහස මැනවින් හෙලිකර ඇත.

(iv) නිසඳැස් ආකෘතිය යොදාගැනීම තුළින් කවියාට සිය අරමුණ මැනවින් ඉටුකර ගැනීමට පහසු වී ඇත. තම අදහස් නිරවුල්ව ඉදිරිපත් කිරීමට හැකිවීම සිය හැඟීම් මැනවින් තහවුරු කරවීමට හැකිවීම තම අත්දැකීම සහෘදයා වෙත මැනවින් සමීප කරවීම

**II කොටස**

මෙම පත්‍රයේ ප්‍රශ්නවලට සිසුන් සපයා ඇති පිළිතුරුවල ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව පිළිබඳ සැළකිලිමත් වෙමින් සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.